30 වන පිටුවෙන්

මංගල හා අවමංගල උත්සව, විවිධ ප්‍රසංග, ආගමික කටයුතු යන සියල්ලටම මේ අතරවාරයේ සහභාගි විය යුතුය.

පිරිමින්ටද මේ වගකීම් ඇති මුත් ඔවුන් ඒවා එතරම් සිතට ගන්නවාද යන්න ප්‍රශ්ණයකි. වචනයකින්, දෙකකින් ඒවා අමතක කර දැමීමට ඔවුන් සමත් නිසාය.

සුරතලයට සතුන් ඇති කරනවා නම්, ඔවුනගේ වගකීම භාර ගත යුතු යැයි තරවටු කළ අවස්ථාවෙක, නිවසින් එළියට බැස තම බලු පැටවා තුරුළු කරගෙන බිම හිඳිනා දරුවකු ඔබ දැක තිබේද? රූපවාහිනිය නැරඹීම නතරකොට පොතක්, පතක් බලා ගන්නැයි කී විට, නිදි යහනට වැදී, කොට්ටයක් තුරුළුකොට, දෑස් තරයේ පියාගත් දරුවකුගේ මුහුණ දැක තිබේද ? තමාගේ පපුවෙන් කොටසක් කඩා හැලෙන ආකාරයකුත්, නෙතුපිය නැගෙනා කඳුළක තෙතමනයකුත් ගැහැනියකට මෙන්ම පිරිමියෙකුටත් දැනෙනවාද?

ලිවීමට මෙසේ කාලයක් සොයාගත නොහැක්කේ ගැහැනුන්ට පමණක්ද?

ඩබ්.ඒ. සිල්වා ශූරීන් තම ග්‍රන්ථ නිර්මාණය කළේ, ඔහුගේ දෙනියායේ නිසල, සොඳුරු පරිසරයක වූ නිවහනක තනි පංගලමේය. මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් ජීවත් වූ නිවසට ගියවිට පෙනෙන්නේ, ඔහුගේ කදිම නිර්මාණ බිහි වූ ඒ අපූරු ගැමි පරිසරයය.

බටහිර ලේඛකයෝ, තමන්ට ලිවීමට අවශ්‍ය වූ විට, දුර බැහැර පළාතකින් නිවසක් කුලියට ගෙන, තමාට ඇති තරම් කාලයක්ද ගතකොට, තම ග්‍රන්ථ නිම කරන්නෝය.

එවැනි අවස්ථාවක් ලැබෙනවා නම් යැයි මා කල්පනා කළ වාර අනන්තය. ඒ හා සමඟ මට මැවී පෙනෙන්නේ හිමෙන් වැසුණු වටපිටාවක, උස් ගසින් වටවූ, දර උඳුනක් හා චිමිනියක් සහිත ලීයෙන් තැනූ නිවහනකි. මීදුමෙන් වැසුණු අඩිපාරක් ඔස්සේ කෙරෙනා සක්මනකි. උණු කෝපි කෝප්පයක් පානය කරමින්, ගින්නට අල්ලා අත් රත් කිරීමකි. එලෙස ආරම්භ කරනා දිනයක් ලිවීම සඳහා කෙතරම් කදිමද ?

ඒ සමගම සමසක පමණ කලක්, එවැනි තැන් කිහිපයක ගෙවූ ජීවිතයද මගේ සිහියට නැගෙන්නේය.

මොන්ටානාහි හිමෙන් පිරුණු ලොවක, රෑ මැදියමේ, අට්ටාලයක වැතිරී, තරු පිරුණු අහස දෙස බලා සිටි අන්දමත්, රාත්‍රියෙන් ඇසෙනා විවිධ හඬ හඳුනා ගැනීමට කළ වෑයමත්, දැල්වෙන ගින්නෙන් බිත්තියෙහි මැවෙන ඡායාත්, තාමත් මතකයේ නොමැකෙන ලෙස රැඳී ඇත්තේ, එම පරිසරයේ වූ සිත් මෝහනය කරනා සුන්දර බව නිසාද?

එමෙන්ම මිසුරු හි දී නන් පැහැගත් ගස් කොළන් අතරින් වැදී ආ සිහිල් සුළඟ කපොලක තැවැරෙද්දී, පයට පෑගුණු වියළි කොළ ගීතමය හඬක් නංවද්දී, පීත්ත පටියක් ලෙස දිස්වූ අඩිපාරෙහි ගමන් කළ අයුරු තාමත් දැනෙන්නේ, වර්ණවත් චිත්‍රයක් බඳු වූ එම පරිසරයෙහි වූ වෙනස නිසාද?

කාලයත් සමඟ ලිවීම සඳහා අවශ්‍ය අනෙක් සාධකය, පරිසරයද?

රාජ්‍ය සම්මාන දිනූ සුනේත්‍රා රාජකරුණානායකගේ ‘පොදු පුරුෂයා’ යන ග්‍රන්ථ යට සමහරු බැණ වැදුණෝය. මීට හේතුව ඇය නොබියව එම ග්‍රන්ථය රචනා කිරීමද? පිරිමින්ගේ ව්‍යවහාර බස එලෙසින්ම ලිවීම ගැහැනියක විසින් නොකළ යුතු දෙයක්ද? තමා දකිනා, අසනා දේ එලෙසින්ම ලිවිය හැක්කේ පිරිමියෙකුට පමණද? සමහර පිරිමි, ගැහැනුන් ලියන ‘ග්‍රන්ථ’ විවේචනය කිරීමට පවා මැලිවන්නෝය.

බොහෝ පිරිමි, අන්තර් ජාලය ඔස්සේ සකසාගත් වෙබ් අඩවි පාවිච්චි කරන්නෝය. ඒවා සීමා වන්නේ පිරිමින්ට පමණී. ගැහැනුන්ට ඒවාට සම්බන්ධ වීමට වරම් නැත්තේය. නුසුදුසුකම ‘ගැහැනුකම’ ය. ඒ අතින් බලනවිට ලිවීමේදී පවා ‘ගැහැනුකම’ අවාසියක් වන්නේද?

එසේනම්, මේ සියළු බාධක මැඩ “හදවතින් ලියන්නේ කෙසේදැයි ” මම මගෙන්ම අසාග නිමි.

Victoria Mercantile
LAWYERS

- Advice On Legal Matters
- Motor Vehicle Accident Claims
- Debt Recovery & Enforcement
- Powers of Attorney
- Conveyancing
- Wills

Anne Heenatimulla LLM (Monash)
Barrister & Solicitor
Attorney-at-Law (Sri Lanka)

Phone: (03) 8787 8590
Fax: (03) 9015 6724
Mobile: 0401 684 689
Email: VMLawyers@y7mail.com
10 Yellowbox Crescent, Lyndhurst VIC 3975






